**14-04-2026** **උදෑසන මුරලි** **ඕම් ශාන්ති** **බාප්දාදා** **මධුබන්**

**සාරය:** සුමිහිරි දරුවනි, දේවතාවරුන් වීමට නම් අමෘතය පානය කර අන් අයටත් එය බීමට සලස්වන්න. උසස් අයෙක් වන්නේ අමෘතය පානය කරන්නන් පමණි.

**ප්‍රශ්නය:** ස්වර්ණමය යුගයේ පුරවැසියන් මෙම කාලයේදී සූදානම් වන්නේ කුමන පදනමක් මතද?

**පිළිතුර:** මෙම ඥානය සම්බන්ධයෙන් හොඳටම පැහැදී මෙය හරිම හොඳ දෙයක් බව කිය කියාත් නමුත් එය හදාරන්නේවත් කිසිම උත්සාහයක් දරන්නේවත් නැතිව සිටිනා අය පුරවැසියන් වේ. ආකර්ෂණීය පෙළඹීමකට හසු වෙනවා යනු පුරවැසියෙක් වීමයි. සූර්ය වංශික රජ කෙනෙක් හෝ රැජිණක් වීමට නම් උත්සාහය අවශ්‍ය වේ. ඉගෙනීම කෙරෙහි සම්පූර්ණ අවධානය යෙදවිය යුතුව ඇත. නිරන්තර ස්මරණයේ නිරතව සිටියා නම් ඔබට උසස් තත්ත්වයක් දිනා ගෙන අන් අයටත් එයම කිරීමට දිරිමත් කළ හැකි වේ.

**ගීතය:** ඔබ රාත්‍රිය නින්දෙනුත් දහවල කුස පුරවමිනුත් ගත කළා ...

ඕම් ශාන්ති. දියමන්ති මෙන් තිබූ ජීවිත දැන් සිප්පි කටු සේ පත්ව ඇති බව කියැවෙන ගීතයට ඔය දරුවන් දැන් ඇහුම් කන් දුන්නා. මෙය සාමාන්‍ය දෙයක්. කුඩා දරුවකුට පවා මෙය තේරුම් ගත හැකියි. බාබා ඉතාමත් පහසුවෙන් මෙය පැහැදිලි කරනා නිසා කුඩා දරුවෙකුට පවා හරිම පහසුවෙන් මෙය තේරුම් ගත හැකියි. සත්‍ය නාරායනගේ කතාන්දරය කියනා විට කුඩා දරුවන් පවා වාඩි වී අහගෙන සිටිනවා. කෙසේවෙතත්, ඒ ආධ්‍යාත්මික කණ්ඩායම් වලදී කතාවට ගන්නා ඒ සියල්ල කතාන්දර පමණයි. ඒ කතාන්දර ඥානය නොවෙයි. ඒවා මිනිසුන් විසින් සෑදූ කතාන්දරයි. ගීතා කතාවත් රාමායන කතාවත් තිබෙනවා. ආගමික ග්‍රන්ථ වල මෙවන් කතාන්දර රැසක් තිබෙනවා. ඒ සියල්ල කතාන්දරයි. කතාන්දර ඇසීමෙන් කිසිම යහපතක් සිදු වෙනවාද? මෙය සත්‍ය නාරායනගේ කතාන්දරයයි. සාමාන්‍ය මනුෂ්‍ය තත්ත්වයෙන් නාරායන වීමට ඇති සැබෑ සත්‍ය නාරායනගේ කතාන්දරයයි. මෙම කතාන්දරයට ඇහුම් කන් දීමෙන් ඔබ සාමාන්‍ය මනුෂ්‍ය තත්ත්වයෙන් නාරායන බවට පත් වේ. මෙය අමරණීයත්වයේ කතාව ද වේ. ඔබ මිනිසුන්ට ආරාධනා කරනවා: පැමිණෙන්න. අමරණීයත්වයේ කතාව හා අමරණීය දේශයට යාමේ කතාව අපි ඔබට කියා දෙන්නම්. ඒ කියලත් කිසිම කෙනෙකුට මේ දේවල් තේරෙන්නේ නැහැ. ග්‍රන්ථ වල කතාන්දර අස අසා සිටි ඔවුන්ට කිසිම දෙයක් ලැබී නැහැ. මිනිස්සු ලක්ෂ්මී හා නාරායන දේවාලයට යනවා: එන්න අපි ගිහින් ඒ පිළිම වල දර්ශනයක් ලබා ගෙන එමු. ශ්‍රේෂ්ඨ අයව දැක බලා ගනිමු. එවන් සිරිතක් පැවති තිබෙනවා. අතීතයේ සිටි ඍෂිවරුන් මුණිවරුන් ආදී සෑම කෙනෙක්ම ඉදිරියේ ඔවුන් දණ නම නමා සිටියා. නිර්මාපක හා නිර්මාණයේ කතාව දන්නවාදැයි ඔවුන්ගෙන් අහන්න. දන්නේ නැහැයි කියාවි. නිර්මාණකරුගේ හා නිර්මාණයේ මෙම කතාව හරිම පහසු දෙයක් බව ඔය දරුවන්ට දැන් තේරෙනවා. ඒ ඇල්ෆා හා බීටාව පිළිබඳ වූ කතාවයි. ප්‍රදර්ශන වලට පැමිණෙන්නන් කතාන්දරයට හොඳින් ඇහුම් කන් දී සිටියත් ඉන් ඔවුන් පාරිශුද්ධ වන්නේ නැහැ. පාපයේ ගැලීමේ සිරිත සදාකාලිකව පැවතුනක් කියා තමයි ඔවුන් විශ්වාස කරන්නේ. දේවාල වල දේවතා පිළිම ඉදිරියට ගිහින් ඔවුන් ඔබ නම් පාපයෙන් තොරයි කියා ගීත ගයනවා. එතැනින් එළියට පැමිණි පසු පාපයේ ගැලීම සදාතනික දෙයක් කියා කියනා ඔවුන් එයින් තොරව ලෝකය පැවතෙන්නේ කෙසේදැයි කියා අසනවා. ලක්ෂ්මී නාරායනට පවා දරුවන් සිටියා කියා ඔවුන් කියනවා. ඔවුන් මෙසේ කියනා විට ඔබ මොනවාද කියන්නේ ? මිනිසුන් සමඟ ඔවුන්ව සමාන කිරීමට ඔබට බැහැ. දේවතාවරුන් පවා මානව ජීවයන්ය. ලක්ෂ්මී නාරායන රාජ්‍යයේ දී ඔවුන් ඉතාමත් සතුටින් සිටියා. බාබා ඔබට ඉතාමත් පහසු දේ කියා දෙනවා. සැබවින්ම මෙම භාරතයේ දෙව්ලොව තිබුණා: එය ලක්ෂ්මී නාරායන රාජ්‍යය ලෙසින් පැවතියා. ඔවුන්ගේ ප්‍රතිමාත් තිබුණා . ස්වර්ණමය යුගයේ සිටි සෑම කෙනෙක්ම විශ්වාස කළේ එය තමාගේ රාජ්‍යය කියලායි. එහිදී කිසිම කෙනෙක් දුකින් සිටියේ නැහැ. ඔවුන් මුලුමනින්ම පාපයෙන් තොරයි. ඔවුන් වෙනුවෙන් විශාල දේවාල සාදා තිබෙනවා. ඒවා තිබුණේ මීට වසර 5000 කට පෙරයි. දැන් ඒවා නැහැ. දැන් මේ ඇත්තේ කලි යුගයේ අවසානයයි. මිනිස්සු එකිනෙකා සමඟ ඇණකොටා ගන්නවා. පරමාත්ම දෙවියන් සිටින්නේ නිර්වාණ දේශයේ ඉහළින්මයි. ඇත්තටම කියනවා නම්, අප ජීවාත්මයනුත් සිටියේ එහියි. පසුව අපි අපගේ චරිත කොටස රඟදැක්වීමට මෙහි පැමිණියා. මුලදී අපි සිටියේ ලක්ෂ්මී නාරායනගේ අධිරාජ්‍යයේයි. එහි විශාල සතුටක් හා ප්‍රමෝදයක් තිබුණා. පසුව අපට උපත් 84 ක් ගැනීමට සිදු වුණා. උපත් 84 චක්‍රය ගැන සඳහන් වී තිබෙනවා.

වසර 1250 ක් අපි සූර්ය වංශයේ රජකම් කළා. එහි අසීමිත සතුටක් තිබුණා. එහි සිටි මිනිසුන් මුලුමනින්ම පාපයෙන් තොරයි. දියමන්ති මුතු මැණික් ඔබ්බවා සැදූ මාළිගා එහි තිබුණා. අධිරාජ්‍ය පාලනය කළ අපට පසුව උපත් 84 ක් ගැනීමට සිදු වූවා. ලෝක ඉතිහාසයේ හා භූගෝලයේ කල්ප චක්‍රය කරකැවෙමින් ඉදිරියට යනවා. කල්ප බාගයකටම සතුට තිබුණා. අපි රාම රාජ්‍යයේ සිටි අතර පසුව ජනගහනය එන්න එන්නම වැඩි වුණා. ස්වර්ණමය යුගය අවසානයේදී එම ජනගහනය 900,000 න් මිලියන දෙකක් දක්වා වර්ධනය වුණු අතර පසුව රිදී යුගයේ උපත් 12 දීත් විශාල සතුටක් හා සුවයක් තිබුණා. එකළ තිබුණේ එක් ධර්මයක් පමණයි. ඉන් අනතුරුව සිදු වූයේ කුමක්ද? රාවණ රාජ්‍යය ඇරඹුණා. රාම රාජ්‍යය හා රාවණ රාජ්‍යය ගැන මම කෙතරම් පහසුවෙන් පැහැදිලි කරනවාදැයි බලන්න. කුඩා දරුවන්ටත් මේ ලෙසින් කියා දිය යුතුයි. ඊට පස්සේ ? දියමන්ති මුතු මැණික් ඔබ්බවා සැදූ සියලුම රත්‍රං මාළිගා සියල්ල භූමිකම්පා වලට යටවෙන්න පටන් ගත්තා. භූමිකම්පා සිදු වීමට පටන් ගත්තේ භාරතීය ජනයා පාපකාරී වී රාවණ රාජ්‍යය ඇරඹුණු දා පටනුයි. පාරිශුද්ධ බවින් සෑම කෙනෙක්ම අපිරිසිදු වීමට පටන් ගත්තා. ස්වර්ණමය ලංකාව යට ගිලුණු බව කියනවා. දේවාල ආදිය සෑදීමට කුමන හෝ දෙයක් ඉතිරිව තිබෙන්න ඇති. භක්ති මාර්ගය ඇරඹුණා: මිනිස්සු පාපකාරී වෙන්න පටන් ගත්තා. රාවණ රාජ්‍යයේත් ඔවුන්ගේ ආයු කාලයේත් අඩු වීමක් වෙන්න පටන් ගත්තේ එතැන් පටනුයි. පාපයෙන් තොර යෝගීවරුන් ලෙසින් සිට ඔවුන් ශරීර සන්තර්පණය කරනා පාපකාරී භෝගීන් වුණා. රජ, රැජිණ කොයි වගේද පුරවැසියනුත් පාපකාරී වුණා. මේ කතාන්දරය ඉතාමත් පහසුයි. කුඩා දියණියන් මෙම කතාව කියා දුන්නොත් වැදගත් ප්‍රභූ පිරිසට ලැජ්ජා හිතේවි. පරමාත්ම පියා මෙහි සිට දැන් ඔබට කියා දෙනවා. ඔහු ඥාන සාගරය සේම පාරිශුද්ධකරුයි. පසුව තඹ යුගයේ දී ඔබ ශරීර සන්තර්පණයේ යෙදෙනා අය බවට පත් වී අපිරිසිදු වුණා: අනිකුත් ආගම් වල පැවැත්ම ඇරඹුණා. අමෘතයේ කුල්මත අවසන් වුණා. රණ්ඩු සරුවල් පටන් ගන්නවා. තඹ යුගයේ සිට වැටෙන්න පටන් ගත් අපි කලි යුගයේ අයටත් වඩා පාපකාරී වුණා. අපි දිගටම හනුමන් හා ගණදෙවි රූප සාදමින් පැමිණියා. ගල් බුද්ධියක් ඇති අය බවට පත් වීමට පටන් ගත් අපි එතැනින් ගල් වන්දනා කිරීම ඇරඹුවා. ගස් ගල් වල දෙවියන් සිටිනවායි අපි විශ්වාස කළා. අපි ඒ සියලු දේ කරගෙන ඒමත් සමඟ භාරතය මෙවන් තත්ත්වයකට පත් වූවා. පරමාත්ම පියා දැන් කියන්නේ: වස අතහැර දමන්න. අමෘතය පානය කරන්න. පාරිශුද්ධ වී ඔබගේ රාජධානිය දිනා ගන්න. වස අතහැර දැමූ පසු ඔබ මානව තත්ත්වයෙන් දේවතා තත්ත්වයට පත්වේවි. ඒත් ඔබ එය අතහැර දමන්නේ නැහැ. ඒ වසටම කාන්තාවන් තාඩන පීඩන වලට ලක් කරනවා. මෙන්න මේ නිසා තමයි ද්‍රවුපති ආරක්ෂාව ඉල්ලා කන්නලව් කළේ. අමෘතය පානය කිරීමෙන් තොරව දේවතාවරුන් වීම කළ නොහැක්කක් බව ඔබට තේරෙනවා. පරමාත්ම පියා කියනවා: උසස් වුණේ නැතිනම් ඔබට දෙව්ලොවට යා නොහැකියි. උසස්වට සිටි අය දැන් දූෂිත අය බවට පත් වෙලා. ඔබ දැන් අමෘතය පානය කර උසස් විය යුතුයි. පරමාත්ම පියා කියනවා: නිරන්තරයෙන් මා පමණක් සිහි කරන්න. ඔබට ගීතාව අමතක වෙලා ද? ගීතාව නිර්මාණය කළේ මමයි නමුත් ඔවුන් එයට ක්‍රිෂ්ණාගේ නම ඇතුල් කරලා. ලක්ෂ්මී හා නාරායනට ඔවුන්ගේ රාජධානිය දුන්නේ කවුද? අනිවාර්යෙන්ම පරමාත්ම දෙවියන් විය යුතුයි. පරමාත්ම දෙවියන් ඔවුන්ගේ පෙර උපතේ දී ඔවුන්ට රාජයෝගාව උගන්වා තිබුණා. නමුත් ක්‍රිෂ්ණාගේ නම තමයි සඳහන් කර තිබෙන්නේ. මෙය අන් අයට පැහැදිලි කිරීමට ඔබ පුහුණු විය යුතුයි. එය ඉතාමත් පහසු කතාන්දරයක්. බාබාට කොපමණ කාලයක් ගත වුණා ද? මෙතරම් පහසු කරුණක් ඇතැම් අයට පැය බාගයක් කියා දීවත් තේරුම් ගත නොහැකියි. මෙන්න මේ නිසා තමයි පරමාත්ම පියා කියන්නේ: සෑම කෙනෙකුටම මෙම කෙටි කතාව කොහේ හෝ වාඩිගෙන කියා දෙන්න. එක අතකට පින්තූරයක් ගන්න. ස්වර්ණමය යුගයේ ලක්ෂ්මී හා නාරායනගේ රාජ්‍යය පැවති අතර රිදී යුගයේ රාමා හා සීතාගේ රාජ්‍ය පැවතුණා. පසුව තඹ යුගයේදී රාවණ රාජ්‍යය ඇරඹුණා. එය එතරම්ම පහසු කතාවක්. අපි අනිවාර්යෙන්ම දේවතාවරුන්ව සිටියා. දැන් ක්ෂත්‍රියයන්. වෛශ්‍යවයින් හා ශුද්‍රයින් වී සිටිනවා. දැන් ඔබ තමන්ව දේවතාවරුන් ලෙස නොසලකනා නිසා හින්දුවරුන් කියා හඳුන්වා ගන්නවා. උසස් ධර්මයක් ඇතිව උසස් ක්‍රියා කරමින් සිටි ඔබ ඔබගේ ධර්මයෙන් හා කර්මයෙන් අධර්මිෂ්ඨ වෙලා. ඔය කුඩා දියණියන් වාඩි වී මේ ආකාරයෙන් දේශන දුන්නොත් මුලු සභාවම පුදුමයට පත් වේවි. බාබා මේ කියන්නේ සෑම මධ්‍යස්ථානයකම සිටිනා අයටයි. මේ වයසක අය කිසිම දෙයක් ඉගෙන ගන්නේ නැහැ: ඒ නිසා මේ පොඩි කුමාරින්ට කියා දෙන්න. කුමාරින්ගේ නම් සඳහන් කර තිබෙනවා. දිල්ලි හා බොම්බේ වල ඉතාමත් හොඳ කුමාරින්ලා ගණනාවක්ම සිටිනවා. ඒ සෑම කෙනෙක්ම හොඳින් ඉගෙන ගත් අය ඔවුන් අවධානයෙන් සිටිය යුතුයි: ඔවුන්ට විශාල දෙයක් කළ හැකියි. කුමාරින් අවධානයෙන් සිටියා නම් ඔවුන්ගේ නම කීර්තියට ලක් වේවි. ධනවත් පවුල් වල අයගෙන් කලාතුරකින් කෙනෙකුට තමයි එතරම් ධෛර්යයක් උපදින්නේ. ඔවුන් ඔවුන්ගේ ධනයෙන් මත් වෙලා. තම දැවැද්ද ලැබුණු පසු ඔවුන්ට ආයිත් දෙයක් අවශ්‍ය නැහැ. කුමාරි කෙනෙක් විවාහ වී

ගිය පසු ඇය අවලස්සන වී සෑම කෙනෙක්ම ඉදිරියේ වැඳ වැටීමට සිදු වෙනවා. එමනිසා පරමාත්ම පියා ඉතාමත් සරළව පැහැදිලි කර කියා දෙනවා. කෙසේවෙතත් , දිව්‍යමය ගුණධර්ම ඇති අය බවට පත් වීම පිළිබඳව ඔවුන් සිතන්නේ නැහැ. බලන්න, මේ දිනවල හරිහැටි ඉගෙන නොගත් අය පවා පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්. ලෝක් සභා මන්ත්‍රීවරුන් ආදීන් වෙනවා. ඉගෙන ගැනීමෙන් කුමන තත්ත්යකට පත් විය හැකි දැයි කියා බලන්න. මේ ඉගෙනුම ඉතාමත් පහසුයි. ඔබ මෙය අන් අයටත් ඉගැන්විය යුතුයි. කෙසේවෙතත්, ශ්‍රීමත් පිළිනොපැදීම නිසා ඔවුන් ඉගෙන ගැනීමවත් කරන්නේ නැහැ. ඉතාමත් හොඳ කුමාරීන් කිහිප දෙනෙක්ම සිටිනවා. නමුත් ඔවුන් සිටින්නේ වෙනම මත් වීමක. පොඩි දෙයක් කර ඔවුන් සිතන්නේ මහා ලොකු වැඩක් කළායි කියලයි. දැන් , තවත් විශාල වැඩ කොටසක් කිරීමට තිබෙනවා. මේ දිනවල විලාසිතා ආදියෙහි වැඩියෙන්ම නියැලෙන්නේ කුමාරීන්ලායි. එහි නම් ඇත්තේ ස්වභාවික ලස්සනක්. මෙහි ඇති ලස්සන හරිම කෘත්‍රිමයි. කොණ්ඩා මෝස්තර වලටම ඔවුන් විශාල මුදලක් වියදම් කරනවා. ඒ තමයි මායාගේ රාවණ රාජ්‍යයේ පම්පොරිය. ඉන් අනතුරුව රාම රාජ්‍යය නැඟ ඒමට පටන් ගන්නවා. රාම රාජ්‍යය දැන් ස්ථාපනය වෙමින් පවතිනවා. කෙසේවෙතත්, ඔබ කිසියම් හෝ උත්සාහයක් දැරිය යුතුයි. හොඳින් ඉගෙන ගත්තේ නැතිනම් ඔබ කුමන තත්ත්වයක් ලබාවි ද? එහි ගිය විට පැන්ස කිහිපයක් පමණක් අතේ ඇති පුරවැසියෙක් වේවි. අද කාලේ සිටිනා ප්‍රභූවරුන් එහිදී සාමාන්‍ය පුරවැසියන් වේවි. ධනවත් අය මේක හොඳ දෙයක් හොඳ දෙයක් කියා කියුවත් පසුව තම තමන්ගේ වැඩරාජකාරි වල හිරවෙනවා. ඔවුන් මහා ඉහළින් මෙයට ආකර්ෂණය වුණත් පසුව සිදුවන්නේ කුමක්ද? අවසානයේදී කුමක් වේවිද? පුරවැසියන් වේවි. ආකර්ෂණීය පෙළඹවීමකට හසු වෙනවා යනු පුරවැසියෙක් වීමයි. උත්සාහය දරන්නන් රාම රාජ්‍යයට පැමිණේවි. පැහැදිලි කිරීම ඉතාමත් පහසුයි. මෙම කතාන්දරයේ සතුට රඳවාගන්නා අය එතෙර වේවි. අපි සාම දේශයටත් එතැනින් සතුටේ දේශයටත් යන්නෙමු. ඔබ විසින් කළ යුත්තේ බාබාව සිහි කර අන් අයවත් ඒ සඳහා දිරිගැන්වීම පමණයි. උසස් තත්ත්වයක් දිනා ගත හැක්කේ එවිට පමණයි. ඔබගේ ඉගෙනීම කෙරෙහි අවධානය යොමු කරන්න. ඔබේ අතේ පින්තූර තිබිය යුතුයි. බාබා, ලක්ෂ්මී හා නාරායන වන්දනා කරනා කාලයේදී ඒ පින්තූරය නිතරම සාක්කුවේ දමා ගෙන සිටියා. පොඩි ඡායාරූපත් ගණනාවක්ම තිබුණා. ඒ පින්තූර ගැන පැහැදිලි කර කියා දෙන්න. මේ බාබා. ඔබ උරුමය දිනාගන්නේ ඔහුගෙනුයි. දැන් පාරිශුද්ධත්වයට පත්වී පරමාත්ම පියාව සිහි කරන්න. බැජ් එකේත් විශාල ඥාන සම්භාරයක් තිබෙනවා. මුලු ඥානයම එහි අන්තර්ගතයි. අන් අයට පැහැදිලි කර දීමත් ඉතාමත් පහසුයි. එක් තත්පරයකින් ඔබගේ ජීවන මුක්ති උරුමය පරමාත්ම පියාගෙන් දිනා ගන්න. පැහැදිලි කරනා ඕනෑම කෙනෙක්ට ජීවන මුක්ති තත්ත්වය දිනා ගත හැකියි. අන් සෑම කෙනෙක්ම තම තමන්ගේ ඉගෙනීමේ තරමට තත්ත්වයක් දිනා ගනීවි. ඔවුන් දෙව්ලොවට යාවි. අවම තරමින් අවසානයේදී පැමිණේවි. ජනගහනය වර්ධනය විය යුතුයි. ඉහළම ධර්මය දේවතා ධර්මයයි. ඔවුනුත් පැමිණේවි නේද? පුරවැසියන් සිය දහස් ගණනක් නිර්මාණය වේවි. සූර්ය වංශයේ කොටසක් වීමට උත්සාහයක් අවශ්‍යයි. සේවය කරනා අය පමණයි උසස් තත්ත්වයක් හිමිකර ගන්නේ. ඔවුන්ගේ නම් පවා කීර්තියට ලක් වේවි. කුමාර්කා, ජනක් ආදී අය ඉතාමත් හොඳින් මධ්‍යස්ථාන බලාකියා ගන්නවා. ගැටුම් නැහැ. පරමාත්ම පියා කියන්නේ: නරක දේ දකින්න එපා. නරක දේ ගැන කතා කරන්න එපා. එසේ කියලත් ඇතැම් අය නිතර නිතරම එවැනි දේමයි කතා කරන්නේ. එවැනි අය එහේ ගිය විට කොයි වගේ වේවිද? ඔවුන් මෙතරම් පහසු සේවයක් වත් කරන්නේ නැහැ. කුඩා දියණියන්ට පවා මෙය පැහැදිලි කර කියා දිය හැකියි: ඔවුන්ටත් පුළුවනි ඥානය දෙන්න. වානර සේනාව ඉතාමත් ප්‍රසිද්ධයි. රාවණගේ සිරකුටියේ සිරවී සිටිනා සීතාවරුන්ව නිදහස් කළ යුතුයි. මිනිස්සු නොයෙකුත් ආකාරයේ කතාන්දර සාදා තිබෙනවා. කවුරු හෝ කෙනෙක් එවන් දේශන දිය යුතුයි. අනිත් අය නිකම් අහවල් අහවල් කෙනා ගොඩාක් ආකර්ෂණය වුණා කියා පමණයි කියන්නේ. ඔවුන්ගෙන් අහන්න: ඔබ කවුරු වෙන්නද කැමති? ඔවුන් නිකම්: මේ ඥානය හරිම හොඳයි කියා අනිත් අයට කිය කියා ඉන්නවා පමණයි. කෙසේවෙතත්, ඔවුන් කිසිම දෙයක් තේරුම් ගන්නේ නැහැ. ඉතින් එහි ඇති ඵලය කුමක්ද? අච්චා.

සුමිහිරි, ආදරණීය, බොහෝ කලක් නැති වී සිට දැන් හමු වුණ දරුවන්ට ඔබගේ මව, පියා, බාප්දාදා සෙනෙහසින් සිහිපත් කර සුබ උදෑසනක් ප්‍රාර්ථනා කරයි. ආධ්‍යාත්මික පියාගෙන් ආධ්‍යාත්මික දරුවන්ට නමස්කාර.

**ධාරණය සඳහා සාරාංශය:**

1. දිව්‍යමය බුද්ධියක් ඇති අයෙක් බවට පත්වීමට නම් ඉගෙනීම කෙරෙහි සම්පූර්ණ අවධානය යොමු කරන්න. ශ්‍රීමත් වලට අනුකූලව හොඳින් ඉගෙන ගෙන අන් අයටත් උගන්වන්න. ඔබගේ සීමිත ධනය හා විලාසිතා කෙරෙහි ඇති මත්වීම අතහැර දමා මෙම අසීමිත සේවයේ නිරත වන්න.
2. නරක දේ අහන්න එපා. නරක දේ බලන්න එපා. නිශ්ඵල දේ ගැන කථාබස් කරන්න එපා. කිසිම කෙනෙකුගේ ආකර්ශනයට හසුවන්න එපා. සත්‍ය නාරායන වීමේ කෙටි කතාව සැමට කියන්න.

**වරදානය:** ඔබ ජීවමානව මියැදීමෙන් ඔබේ නව ජීවිතය පිළිබඳව අවධානයෙන් සිටිමින් ඔබේ භෞතික ඉන්ද්‍රියන් ජය ගනිත්වා.

සම්පූර්ණයෙන්ම ජීවමානව මියගොස් සිටින අතර මිය ගිය ඔබ කිසිදු භෞතික ඉන්ද්‍රියකින් ආකර්ෂණය විය නොහැක. ජීවත්වී සිටින අතර මිය යාම යන්නෙන් අදහස් කරන්නේ ඔබ සියල්ලටම මිය ගොස් ඇති බවත් ඔබේ පැරණි ජීවිතය අවසන් වී ඇති බවත්ය. ඔබ නව උපතක් ලබා ඇති බැවින්, ඔබේ නව උපත සහ නව ජීවිතය තුළ භෞතික ඉන්ද්‍රියන් ඔබට බලපෑම් කරන්නේ කෙසේද? බ්‍රහ්ම කුමාරයෙකුගේ හෝ කුමාරියකගේ නව ජීවිතය තුළ, භෞතික ඉන්ද්‍රියන් මගින් බලපෑම් කිරීම යන්නෙන් අදහස් කරන්නේ කුමක්ද යන්න පිළිබඳ කිසිදු දැනුමකින් ඔබ සම්පූර්ණයෙන්ම ඔබ්බට ගොස් ඇත. සුළු හුස්මක්වත්, එනම් ශුද්‍රයෙකුගේ කිසිදු සංස්කාරයක් ඔබ මත රැඳී සිටීමට ඉඩ නොදෙන්න.

**පාඨය:** අම්රිත් වේලාවේ දී ඔබේ හදවතේ පරමාත්ම දෙවියන්ගේ සෙනෙහස ඒකාබද්ධ කර ගන්න, එවිට වෙනත් කිසිදු සෙනහසකට ඔබ ආකර්ෂණය නොවනු ඇත.

***** ඕම ශාන්ති *****

**අව්‍යක්ත සංඥාව: ශ්‍රේෂ්ඨ වීම සඳහා මිහිරි බව සහ නිහතමානිකමේ ගුණධර්ම ධාරණය කරගන්න.**

සමූහයක සාර්ථකත්වය අත්කර ගැනීම සඳහා, ඔබේ නිරහංකාරකමේ සිංහාසනයේ නිරන්තරයෙන් අසුන්ගෙන සිටින්න. මෙම සිංහාසනයේ හිඳ ඔබේ වගකීම් ඔටුන්න පැළඳගෙන ඔබේ අනාගත තත්ත්වය නිර්මාණය කරන්න. ඔබේ සිංහාසනයෙන් ඉවත් නොවන්න. ඔබේ සිංහාසනයේ අසුන්ගෙන සිටිය දී සියල්ල කරන්න, එවිට ඔබට සාර්ථකත්වය දිගටම ලැබෙනු ඇත. 'ඔබ පළමුව' යන පාඩම ස්ථිර වේවා, මෙමගින් ඔබේ සංස්කාර සියල්ලන් සමඟ සහයෝගයෙන් ක්‍රියා කරනු ඇත.